# පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

## සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා
## පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය

# පුරප්පාඩු

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ පවතින පහත සඳහන් පුරප්පාඩුව පිරවීම සඳහා යථා යෝග්‍ය පරිදි සුදුසුකම්ලත් අයවළුන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**අධ්‍යක්ෂක තනතුර - (නීති හා බලගැන්වීම්) - (HM 1-1) - තනතුරු 01**

**රැකියා විස්තරය :**

ඕනෑම අධිකරණයක්, විනිශ්චය සභාවක් හෝ අධිකාරියක් ඉදිරියේ අධිකාරිය නියෝජනය කිරීම, අධිකාරිය වෙනුවෙන් නඩුකීමේ දැන්වීම් භාර ගැනීම සහ අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවන් හා නැතිහිදී අධිකාරිය වෙනුවෙන් පෙනී සිටීම හා නියෝජනය කිරීම, පනත මඟින් නියම කර ඇති පරිදි අධිකාරියේ ක්‍රියා කටයුතු වලට අනුකූලව ක්‍රියා කිරීම හා ඒවා බලාත්මක කිරීම, පාරිභෝගික කටයුතු අධිකාරි පනත යටතේ නිකුත් කරනු ලබන නියෝගයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නිෂ්පාදකයින් හා වෙළඳුන් අපොහොසත්වන අවස්ථාවන්හිදී එවන් කාරණා කටයුතු හා නඩු කටයුතු විමර්ශනය කිරීම හා පනත මඟින් නියම කර ඇති පරිදි නීතිමය කටයුතු සිදු කිරීම / නඩු පැවරීම, නීතිපති දෙපාර්තමේන්තුව වෙනත් නීතිමය උපදේශකයින් හා අදාළ ආයතන සමග අවශ්‍ය අවස්ථාවලදී සම්බන්ධීකරණය පවත්වාගෙන යාම, ඕනෑම නිෂ්පාදකයෙකු හෝ වෙළෙන්දෙකු හෝ ඕනෑම නිෂ්පාදක හෝ වෙළඳ ආයතනයක් හා සමග පනත මඟින් පනවා ඇති හා නියම කර ඇති පරිදි, අධිකාරිය විසින් එළඹෙනු ලබන ගිවිසුම් පිළියෙළ කිරීම හා බලාත්මක කිරීම පිළිබඳ වගකීම් භාරය දැරීම, අධිකාරිය විසින් නිකුත් කරනු ලබන සියලුම නියෝගයන් සහ අධිකාරිය විසින් සම්බන්ධව ඇති වෙනත් නීතිමය කටයුතු වලට අදාළ වාර්තා පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම, අධිකාරිය විසින් සංස්ථාපිත වෙනත් නෛතික කාර්ය පටිපාටි පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම, පාරිභෝගික පැමිණිලි ඒකකයේ කටයුතු අධීක්ෂණය කිරීම / නිරීක්ෂණය කිරීම, අධිකාරිය විසින් නිකුත් කරනු ලැබීමට නියමිත ගැසට් දැන්වීම් / නිවේදන පිළියෙල කිරීම, අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාල විසින් මෙහෙයවනු ලබන නෛතික කටයුතු සම්බන්ධීකරණය කිරීම හා අධීක්ෂණය කිරීම, අධිකාරියේ කාර්ය කටයුතු පිළිබඳව එහි කාර්ය මණ්ඩලයට උපදෙස් දීම හා පැහැදිලි කිරීම, නියෝගයන්ට / හෝ රෙගුලාසි / නියමයන් මඟින් එහිදී ඇරඹුණු ගත කර ඇති මාර්ගෝපදේශ අර්ථ නිරූපණය කිරීම, අධිකාරියේ වෙනත් සියලු අංශවලට සහය සේවා සැපයීම පාරිභෝගික කටයුතු සභාව සඳහා සහය සේවා සැපයීම, පාරිභෝගික ආරක්ෂණ හා තරඟ විරෝධී චර්යාවන් සම්බන්ධයෙන් ජාත්‍යන්තර තලයේ / ක්ෂේත්‍රයේ නීතිමය සංවර්ධන කටයුතු පිළිබඳ අවධානය හා අවබෝධය පවත්වා ගෙන යාම හා පහත දැක්වෙන කරුණු කාරණා පිළිබඳ අධිකාරියේ අධ්‍යක්ෂක ජනරාල්වරයාට සහ සාමාජිකයින්ට සහය ලබා දීම.

(i) නඩු කටයුතු හා සම්බන්ධව ඕනෑම කාරණාවකදී අවශ්‍යවන පැහැදිලි කිරීම් සිදු කිරීම.

(ii) අර්ථ නිරූපණයන්

(iii) නියාමනයෙකු ලෙස ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී අදහස් / මත ප්‍රකාශ ක්‍රමවත්ව / විධිමත්ව දැක්වීම

(iv) කාර්ය මණ්ඩලය, ශ්‍රමිකයන්, ශ්‍රමය, ප්‍රසාධක වන්දි ගෙවීම හෝ විනය පිළිබඳ කටයුතු වලදී හට ගැනෙන වෙනත් ඕනෑම කාර්යයක්

සහ

(v) අධිකාරිය හා සම්බන්ධව එහි ක්‍රියාවන් සහ හෝ බැඳියාවන් / අභිලාෂයන් පිළිබඳව සෘජුවම අධිකාරිය සම්බන්ධ වන වෙනත් ඕනෑම හා වැදගත් ගැටළු හා කාරණා හා වෙනත් කරුණු.

**සුදුසුකම් :**

**බාහිර** : නීතිඥවරයෙකු වීම හා පශ්චාත් උපාධි සුදුසුකම් (Masters) හා සමග දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 15 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

**අභ්‍යන්තර** : තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ කාණ්ඩයේ (MM 1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවය.

**වැටුප් පරිමාණය** : HM 1-1-2016 : රුපියල් (81,670-15x2,270-115,720) - (2016/02 අංකය දරන DMS චක්‍රලේඛය ප්‍රකාරව)

**දීමනා** : ඉහත වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව වෘත්තියවේදී දීමනාව සහ වෙනත් අදාළ දීමනා සියල්ලද අදාළ රජයේ චක්‍රලේඛයන් පරිදි ගෙවනු ලැබේ.

**ප්‍රවාහන සහ ඉන්ධන දීමනාව** : නිල වාහනයක් භාවිතා කිරීමට හෝ මාසිකව රු. 50,000.00 ක ප්‍රවාහන දීමනාව සහ ලීටර් 120 ක ඉන්ධන දීමනාව ලැබීමට හිමිකාරිත්වය ඇත.

**වයස** : අවුරුදු 35 ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට අදාළ නොවනු ඇත.

**පොදු කොන්දේසි :**

**බඳවා ගැනීමේදී වැටුප** : බාහිරව බඳවා ගනු ලබන පුද්ගලයන් වැටුප් පරිමාණයේ මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. අභ්‍යන්තරව බඳවා ගනු ලබන පුද්ගලයන්ගේ වැටුප් ආයතන සංග්‍රහය - I හි VII වන පරිච්ඡේදයේ විධිවිධාන / ප්‍රතිපාදන අනුව තීරණය කරනු ලැබේ.

**පත්වීමේ ස්වභාවය** : තනතුර ස්ථිර වන අතර, සේවක අර්ථ සාධක අරමුදලට (EPF) සහ සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට (ETF) දායකත්වය හිමිවන අතර, අදාළ වැටුප් රජයේ චක්‍ර ලේඛයන්හි සඳහන් විධිවිධාන / ප්‍රතිපාදන පරිදි ගෙවනු ලැබේ.

- තනතුරට පත් කරනු ලබන බාහිර අයදුම්කරුවෙකු වසර (03) තුනක පරිවාස කාලයකට ලක් කරනු ලැබේ.

**වෙනත් කරුණු**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතුය.
- තනතුරට පැවරෙන රාජකාරී මැනවින් ඉටුකිරීමට හැකි වනසේ මනා කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- අනර්ඝ හා විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

සුදුසුකම් ලත් අයදුම්කරුවන් මෙම දැන්වීමේ දින සිට දින 14 ක් ඇතුළත 2022/02/12 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට සිය ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. සිය සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතිකපත්වල පිටපත් අමුණා එවිය යුතුය. රාජ්‍ය අංශයේ සේවයේ නියුතු සේවකයින්ගේ අයදුම්පත් සිය අදාළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් හා ප්‍රමාදවී, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත්ද ප්‍රතික්ෂේප කරනු ලැබේ. අනිසි බලපෑම් කිරීම්, නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ. අයදුම් කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සටහන් කළ යුතුය. ඔබගේ අයදුම්පත් පහත ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය,**
**2 වන මහල, සතොස මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ල,**
**අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.**